**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**

**காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்**

**OFFICE ON MISSING PERSONS**

# ඇබෑර්තු

- අතුරුහදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය සහ කාර්තව්‍ය ඉටුකිරීම) පනත මගින් පිහිටුවන ලද ආයතනයකි.

- අතුරුහදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පවත්නා පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ප්‍රාදේශීය සම්බන්ධීකාරක (තනතුරු 01) MM 1-1

**රැකියාවේ ස්වභාවය :** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රධාන කාර්යාලය සහ උප කාර්යාල සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීම ඇතුළුව, ප්‍රාදේශීය කාර්යාලයේ සුමට හා කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම සහ නිරීක්ෂණය කිරීම ඇතුළු ප්‍රාදේශීය කාර්යාලයේ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම.

**සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය / මානව හිමිකම් / කළමනාකරණය / පරිපාලනය / මානව සම්පත් කළමනාකරණය හෝ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම **සහ** පළමු උපාධිය ලබා ගැනීමෙන් පසුව, තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් සේවා පළපුරුද්දක් තිබීම.

**වයස:** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:** රු. 91,690 – 10x 2,480 – 15x 3,450 – 168,240/- (01/2025 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව)

**ඉහත සියලුම පුරප්පාඩු සඳහා අදාළ වන කරුණු:**

- **සෑම අයදුම්කරුවෙක්ම:**
    - ✓ ශ්‍රී ලංකාකික පුරවැසියෙකු විය යුතුය.
    - ✓ තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
    - ✓ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකියාව තිබිය යුතුය.
    - ✓ යහපත් චරිතයකින් හෙබි අයෙකු විය යුතුය.
  - පරිගණක සාක්ෂරතාවය සහ සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ මනා දැනුමක් තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
  - අවශ්‍ය තොරතුරු **ඇතුළත් නොකර** ඉදිරිපත් කරනු ලබන ඕනෑම අයදුම්පතක් **ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
  - අයදුම් කරන තනතුර, අයදුම්පතේ සහ අයදුම්පත බහා ඇති ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය. දැනට රජයේ හෝ අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් යොමු කළ යුතුය.
  - අයදුම්කරුවන්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ලබා දී ඇති අයදුම්පත් ආකෘතිය/ මාදිලි නිසි පරිදි සම්පූර්ණ කළ යුතුය.
  - අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.
  - කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ OMP මණ්ඩලය විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයක සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතය.
  - මෙම තනතුරු ස්ථිර වන අතර සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා දායකත්වය ලබා දෙයි.

- බඳවා ගැනීම් සම්බන්ධ අවසන් තීරණය OMP මණ්ඩලය සතු වන අතර, බඳවා ගැනීමේ ක්‍රියාවලියට අදාළ ඕනෑම තීරණයක් ගැනීමේ අයිතිය මණ්ඩලය සතුය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත, අදාළ සහතිකවල පිටපත් සමඟ **2026 ජූලි මස 05** වන දින හෝ ඊට පෙර කාර්යාලයට ලැබෙන පරිදි පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
**සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, අංක 40, 03 වන මහල, බුත්ගමුව පාර, රාජගිරිය.**

**සභාපති**
**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**